**බද්දේගම ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

-------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 21 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට බද්දේගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයට අදාල කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු රු.1,533,417 ක් වූ වියදම් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රතිපාදන සැලසීමේ දී එකී වියදම් සමුච්චිත අරමුදලට හර නොකර, සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වියදම රු.1,533,417 කින් වැඩියෙන් දැක්විණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල කර්මාන්ත වෙනුවෙන් ලැබිය යුතු රු.1,933,417 ක් වූ මූලධන ආධාර සඳහා ප්‍රතිපාදන සැලසීමේ දී එකී ආදායම් සමුච්චිත අරමුදලට බැර නොකර, සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල මූලධන ආධාර රු.1,933,417 කින් වැඩියෙන් දැක්විණි.

(ඇ) ඉකුත් වර්ෂයට අදාල කර්මාන්ත වෙනුවෙන් ලැබී තිබූ මූලධන ආධාර රු.18,089,647 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල මූලධන ආධාර රු.18,089,647 කින් වැඩියෙන් දැක්විණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත ණයගැතියන් රු.3,418,075 ක් වුවද, රු.3,098,757 ක් පමණක් ප්‍රතිපාදන සලසා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල මූලධන ආධාර හා ණයගැතියන් රු.319,318 කින් අඩුවෙන් දැක්විණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයහිමි ශේෂය රු.3,824,541 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.3,534,576 ක් ලෙස දක්වා තිබීමෙන් ප්‍රාග්ධන වියදම් හා ණයහිමියන් රු.289,965 කින් අඩුවෙන් දැක්විණි.

(ඊ) සමාලෝචිත වර්ෂය සඳහා විගණන ගාස්තු හා මුද්දර ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ට ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් ශේෂය රු.6,059,609 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.3,892,161 ක් ලෙස දක්වා තිබීමෙන් ණයහිමියන් රු.2,167,448 කින් අඩුවෙන් දැක්විණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේ දී මිලදී ගෙන තිබූ රු.131,100 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.2,096,141 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.1,546,774 ක් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.549,367 කින් අඩුවෙන් දැක්විණි.

(ඒ) ඉකුත් වර්ෂයට අදාලව ලැබිය යුතු මුද්දර ගාස්තු රු.5,247,410 ක් සඳහා ප්‍රතිපාදන සැලසීමේ දී සමුච්චිත අරමුදල් ගිණුමට බැර නොකර, වර්ෂයේ ආදායම් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ආදායම් රු.5,247,410 කින් වැඩියෙන් දැක්විණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුළ කර්මාන්ත සඳහා ගෙවන ලද රු.295,253 ක්, අත්තිකාරම් ගෙවීම් ලෙස දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාග්ධන වියදම් රු.295,253 කින් අඩුවෙන් දැක්විණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු අය කිරීම වෙනුවෙන් ලබා දී තිබූ වට්ටම් රු.47,674 ක් ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර ගිණුමට හර නොකර, අධිකතා හා ඌනතා ගිණුමට හර කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ වියදම රු.47,674 කින් අඩුවෙන් දැක්විණි.

(ක) රු.47,168 ක් වටිනාකම වූ ඉන්වෙන්ට්‍රි භාණ්ඩ, යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ දක්වා තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් රු.47,168 කින් වැඩියෙන් දැක්විණි.

### 1.3.2 අවිනිශ්චිත ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.5,581,230 ක් වූ අවිනිශ්චිත ගිණුම් හර ශේෂය හඳුනාගෙන ගැලපීම් සිදු නොකර, සමුච්චිත අරමුදල් ගිණුමට හර කර තිබුණි.

**1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.140,828,273 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, පිඹුරුපත් හා යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි හා ණයගැති ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**1.3.4 නීති, රීති, රෙගුලාසි වලට අනුකූල නොවීම**

----------------------------------------------

**උත්සව වියදම්**

----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුතු කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් යම් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන පරිදි වියයුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගතයුතු වුවද, එලෙස විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන 2014 නොවැම්බර් 19 දින බද්දේගම නගර නිර්මාණයට අදාලව, නගර ශාලාව සහ කාර්යාලය, බස් නැවතුම්පල, ළමා උද්‍යාන හා කුළු බඩු අරණ සඳහා මුල්ගල් තැබීමේ උත්සවය වෙනුවෙන් රු.141,301 ක් සභා අරමුදලින් වැයකර තිබුණි.

2014 නොවැම්බර් 19 දින මුල්ගල් තැබීමේ උත්සව පැවැත්වුවද, විගණන දිනය වූ 2015 පෙබරවාරි 28 දින වන විටත්, බස් නැවතුම්පල, ළමා උද්‍යාන හා කුළුබඩු අරණ යන ව්‍යාපෘතිවල ඉදිකිරීම් ආරම්භ කර නොතිබුණු අතර, ඒ සඳහා මුදල් සම්පාදනය කර ගෙන නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩිවූ ආදායම රු.8,034,220 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා අඩුවූ ආදායම රු.3,278,506 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

---------------------

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

--------------------------------------

සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතු රු.3,959,374 ක් වූ වරිපනම් බදු, රු.24,631 ක් වූ අක්කර බදු සහ රු.352,235 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) සහ 159(1) වගන්ති ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.784,875 ක උසාවි දඩ හා රු.5,600,130 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

1988 අංක 74 දරන (සංශෝධිත) පනතින් 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාපති ඇතුළු සියළුම සභිකයින් විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දියයුතු වුවද, සභාපතිවරයා සහ සභිකයින් 09 දෙනෙකු විසින් 2014 වර්ෂය සඳහා වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි. එමෙන්ම 2013 වර්ෂය සඳහා සභාපතිවරයා සහ සභිකයින් 14 දෙනෙකු විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ තුනක සිට පැවත එන රු.72,775 ක් වූ අත්තිකාරම් ශේෂයක් හා රු.17,077 ක් වූ පෙර ගෙවුම් ශේෂයක් හඳුනා ගැනීමකින් තොරව සමුච්චිත අරමුදල් ගිණුමට හර කර ගිණුම් ගැලපීම් කර තිබුණි.

(ආ) රු.2,794,009 ක කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 571(1)(2) හි සඳහන් විධිවිධාන ප්‍රකාරව ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මුදල් රෙගුලාසි 565(4) ප්‍රකාරව තැන්පත් ලෙජර් පවත්වාගෙන යාමේ දී එක් එක් මුදල් වර්ෂය සඳහා අලුත් තැන්පත් ලෙජරයක් විවෘත කර ශේෂ ඉදිරියට ගෙන ඒමේ දී තැන්පත් ලෙජරයේ එක් එක් ගිණුමේ ශේෂය හා එය සැදුම් ගන්නා ආකාරය ඉදිරියට ගෙනවිත් නොතිබුණි.

(ඇ) සභාව විසින් අවස්ථා 10 කදී නිලධාරීන්ට ලබා දී තිබූ රු.49,500 ක අත්තිකාරම් විගණන දිනය වූ 2015 පෙබරවාරි 25 දින වන විටත් පියවා නොතිබුණි.

(ඈ) සභාව සතු PF – 7408 දරන කැබ් රථය සඳහා ඉන්ධන අවශ්‍යතා හඳුනා ගෙන ඉන්ධන ඇණවුම් මගින් ඉන්ධන ලබා ගැනීමට කටයුතු නොකර, සභාපතිවරයා විසින් 2014 දෙසැම්බර් 16 දින සිට 31 දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ඉන්ධන ලීටර් 330.83 ක් අත්පිට මුදලට ලබාගෙන බිල්පත් ඉදිරිපත් කර රු.44,000 ක් සභා අරමුදලින් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(ඉ) සභාවේ සේවය කරන නිලධාරීන් විසින් ලබාගෙන ඇති දේපල ණය වෙනුවෙන්, 2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 11.5.2 ප්‍රකාරව රජය විසින් දරනු ලබන මුදල සභාවට ප්‍රතිපූර්ණය කළයුතු වුවත්, එම විධිවිධාන ප්‍රකාරව කටයුතු නොකිරීම නිසා විගණන දිනය වූ 2015 පෙබරවාරි 24 දින වනවිට රු.902,776 ක් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් සභාවට ලැබිය යුතුව තිබුණි.

**3.3 අවිධිමත් ගනුදෙනු**

-----------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 184 වගන්තිය මගින් ප්‍රධාන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල මත නිකුත් කරන ලද 2005 ඔක්තෝබර් 05 දිනැති අංක : 1413/15 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනයට අනුව ප්‍රාදේශීය සභාවක සභාපති, උප සභාපති හා සභිකයින්ට අදාළ මාසයෙහි පවත්වන ලද සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවීම හා වෛද්‍ය හේතූන් මත හැර සභාවේ අනුමැතිය ඇතිව නිවාඩු ලබා සිටීම මත සභික දීමනා ගෙවිය නොහැකි බව  දක්වා තිබුණ ද, ගැසට් නිවේදනයේ නියමයන්ට පටහැනිව සභා රැස්වීම් සහ කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ වෛද්‍ය සහතික ඉදිරිපත් නොකළ සභිකයින් වෙත 2014 වර්ෂය තුළදී සභික දීමනා ලෙස රු.51,500 ක් සභා අරමුදලින් ගෙවීම් කර තිබුණි.

**3.4 ගැල්වනයිස් බට (GI PIPE) ඌනතාවය**

-------------------------------------------

පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2014 නොවැම්බර් මාසය තුළදී 1 1/4" ගැල්වනයිස් බට 664 ක් සභාව වෙත ලබා දී තිබුණි.

2015 අප්‍රේල් 02 දින සිදු කරන ලද විගණන පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව වෙත ලැබී තිබුණු ගැල්වනයිස් බට 664 ඉන්වෙන්ට්‍රි ලේඛනයේ ඇතුලත් කර නොතිබුණි.  සභාපතිවරුන්ගේ වාචික ඉල්ලීම් මත එම බටවලින් බට 232 ක් යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවට ද, නාගොඩ ප්‍රාදේශීය සභාවට බට 104 ක් ද ලබා දී තිබුණි.

(ii) බද්දේගම ප්‍රාදේශීය සභාව සතුව බට 70 ක් ද, යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව සතුව බට 198 ක් ද, නාගොඩ ප්‍රාදේශීය සභාව සතුව බට නොතිබූ බවත් භෞතික පරීක්ෂාවේදී තහවුරු විය.

(iii) මේ අනුව සභාවට ලබා දී තිබූ 1 1/4" ගැල්වනයිස් බට 664 න් බට 396 ක ඌනතාවයක් පැවතුණි.  බට ඌනතාවයේ වටිනාකම රු.438,372 ක් විය.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

---------------------------------------

**අයවැය පාලනය**

-------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය.  ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5.** **පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය